ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date. 2026.05.07

ඒ.ජී.සනත් ප්‍රියන්ත
8/106/1, අභයපුර,
පරගහකැලේ,
අම්පාර.

පැමිණිලිකාර පාර්ශවය

1. පො.කො. 91267 බණ්ඩාර
පොලිස් ස්ථානය, ඉඟිණියාගල.
(වර්තමාන සේවා ස්ථානය: පොලිස් ස්ථානය, මහියංගනය)

2. ප්‍ර.පො.ප.ජයවීර
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය, ඉඟිණියාගල.

වගඋත්තරකාර පාර්ශවය

**පැමිණිලි අංකය : HRC/AM/95/24/S/PL**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකාර ඒ.ජී. සනත් ප්‍රියන්ත යන අය විසින් 2024.08.09 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ල ගොනු කරමින් දන්වා ඇත්තේ තමා එදිනෙදා කුලී වැඩ කරමින් බිරිඳ හා දරුවන් පෝෂණය කරමින් ජීවිකාව ගත කරන බවත්, 2024.07.20 දින ප.ව. 5.00 ට පමණ කුලී වැඩ අවසන්කර තම බිරිඳ වන ශ්‍යාමලී ප්‍රියදර්ශනී පැදවූ යතුරු පැදියේ තමා පිටුපසින් වාඩිවී අභයපුර ගමේ තිබෙන චමින්ද වෙළඳසැල අසලින් නිවස බලා එමින් සිටියදී එම වෙළඳසැල අසලදී වසම භාර පොලිස් නිලධාරියා වන තමා හොඳින් හඳුනන පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා සිටි බවත්, එම නිලධාරියා තමාට සුහදශීලී ලෙස අතින් සංඥා කළ බැවින් තමාද ඔහුට අතින් සංඥා කර නිවස බලා ගිය බවත් ය.

එසේම, නිවසට පැමිණි පසු තම බිරිඳ යතුරුපැදියෙන් බැස ඒමට උත්සහ කරන විටම ඉහත සඳහන් කළ පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා ද නිවස අසලට පැමිණි බවත්, එලෙස පැමිණ තම බිරිඳගේ අතින් අදිනු දැක තමා එයට හේතුව විමසන විටම තමාට එකී නිලධාරියා අසභ්‍ය වචනයෙන් බනිමින් තමාගේ කන ප්‍රදේශයට ඔහුගේ අතින් දරුණු පහරක් එල්ල කළ බවත්, තමා විසිවී ගොස් නිවසේ ඉදිරිපස දොරෙහි උළුවස්සේ වැදුනු බවත්, නැවත වරක් එම නිලධාරියා එල්ල කළ ප්‍රහාරයට

තමා බිමට ඇද වැටී සිහිසුන් වූ බවත්, එම පහරදීම් හේතුවෙන් තමාගේ හිසට බරපතල හානියක් සිදුව මැහුම් හතක් දමා ඇති බවත්, කන් බෙරයට ද දැඩි හානියක් සිදුව මේ වන විට කන නොඇසෙන තත්ත්වයකට පත්ව දැඩි අපහසුතාවයට පත්ව සිටින බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

තවද, තමාට ඉහත කී පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා පහරදෙන අවස්ථාවේදී තම බිරිඳ තමාව බේරාගැනීමට උත්සහ කරන විට එකී නිලධාරියා තම බිරිඳට ද පහර දෙන ලද බවත්, මෙම නිලධාරියා අධික ලෙස බීමත්ව සිටි බවත්, පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා පහර දෙන විට තමා විසින් ඔහුට කිසිදු ප්‍රතිප්‍රහාරයක් එල්ල නොකර සිටි නමුත්, තමා ඔහුට ප්‍රහාර එල්ල කළ බවට අසත්‍ය චෝදනා කරමින් කරුණු ඉදිරිපත් කර තමාට එරෙහිව අම්පාර මහේස්ත්‍රාත් අධිකරණයේ පො.කො. 91267 බණ්ඩාර නිලධාරියාගේ රාජකාරියට බාධා කළ බවට නඩු පවරා ඇති බවත්, පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා අධික ලෙස බීමත්ව සිටි බව හා එම නිලධාරියා සිදු කළ මෙම ක්‍රියාව ඉඟිණියාගල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිට එම අවස්ථාවේම දැනුම් දුන්නද එය පරීක්ෂා කිරීමට පියවර නොගත් බවත් පැමිණිලිකරු විසින් දක්වා ඇත.

එසේම, මෙම සිදුවීම සිදුවන විට තම දියණිය වන අලුත් ගෙදර දිලිනි තක්ෂිලා හා ඥාති පුත්‍රයෙකු වන කෝනාර මුදියන්සේලාගේ අනුෂ්ක බණ්ඩාර යන අයද නිවසේ සිටි බවත්, පසුව ඥාති පුත්‍රයාට එරෙහිව ද පො.කො. 91267 බණ්ඩාර නිලධාරියාගේ රාජකාරියට බාධා කළ බවට අසත්‍ය චෝදනාවක් නඟා ඔහුවද අත් අඩංගුවට ගත් බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

තමාට සහ තම බිරිඳට සිදුකළ මෙම අමානුෂික පහරදීම් හේතුවෙන් 2024.07.20 දින සිට 2024.07.22 දින දක්වා අම්පාර මහ රෝහලේ ප්‍රතිකාර ලබා මේ වන විට තමා විශේෂඥ වෛද්‍ය ප්‍රතිකාර ද ලබන බවත්, තමා ඉහත කී පො.කො. 91267 බණ්ඩාර නිලධාරියාගේ රාජකාරියට කිසිදු බාධාවක් නොකළ බවත්, මෙම නිලධාරියා සිදුකළ අසාධාරණය සම්බන්ධයෙන් ඉඟිණියාගල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් විමර්ශනයක් සිදුනොකර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියාගේ රාජකාරියට බාධා කළ බවට තමාට විරුද්ධව නඩු පැවරූ බවත්, එබැවින් මෙම අනීතික ක්‍රියාව තුලින් සිදු වූ අසාධාරණයට සාධාරණය ඉටු කර තමාගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන ලෙසත් පැමිණිලිකරු විසින් මෙම පැමිණිල්ල මගින් ඉල්ලා ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

**<u>1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර යන අයගේ කරුණු දැක්වීම</u>**

1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර යන අය විසින් 2024.08.26 දින කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දී ඇත. එකී ප්‍රකාශයේ දැක්වෙන්නේ තමා ඉඟිණියාගල පොලිස් ස්ථානයට අනුයුක්තව ප්‍රජා පොලිස් අංශයේ සේවය කරන බවත්, පරගහකැලේ නැගෙනහිර, පරගහකැලේ බටහිර හා අභයපුර ග්‍රාම නිලධාරි වසම්වල වසම්භාර නිලධාරියා ලෙස සේවය කරන බවත්,

2024.07.20 දින පැය 16.00ට ආසන්න වේලාවකදී අභයපුරදී මෙම සිදුවීම සිදු වූ බවත්, තමා අභයපුර පන්සල ඉදිරිපිට ඇති මාර්ගයේ නිල ඇඳුමින් සැරසී සිටියදී යතුරු පැදියකින් පිරිමි පුද්ගලයකු හා කාන්තාවන් දෙදෙනෙකු පරගහකැලේ දෙස සිට හිමිදුරාව දෙසට පැමිණි බවත්, මෙම යතුරු පැදිය පැදවූයේ පිරිමි පුද්ගලයා බවත්, කාන්තාවන් දෙදෙනා පසුපස සිටිය බවත්, ඔවුන් කිසිවෙක් ආරක්ෂක හිස්වැසුම් පැලඳ සිටියේ නැති බවත් ය.

එසේ හෙයින් තමා එම යතුරු පැදිය නවතන ලෙසට දකුණු අත සෘජුව හරහට දමා සංඥා කළ බවත්, පසුව ඔවුන් යතුරු පැදියේ වේගය අඩුකර වම්පසට ගෙන නැවැත්වීමට උත්සහ දරා නැවත වේගය වැඩිකර ඉදිරියට ගිය බවත්, තමා එම පුද්ගලයින්ගේ නිවස තිබෙන තැන දන්නා බවත්, තමා මීට පෙර වසමේ රාජකාරි සඳහා පැමිණි අවස්ථාවේ ඔවුන් හඳුනාගෙන තිබුණ බවත්, ඔවුන් යතුරු පැදිය නොනවත්වා ධාවනය කිරීම නිසා තමා හට සැකයක් ඇති වූ බවත්, මොවුන් යම් නීතිවිරෝධී මත්පැන් හෝ වෙනත් දෙයක් රැගෙන යන බවට මතු වූ සැකය මත එම යතුරු පැදිය පිටුපසින් තමාගේ යතුරු පැදියෙන් හඹා ගොස් ඔවුන්ගේ යතුරු පැදිය ඔවුන්ගේ නිවස ඉදිරිපිට නැවැත්වූ විගසම යතුරු පැදිය නොනවත්වා ධාවනය කර පලාගියේ ඇයි ද කියා එම පිරිමි පුද්ගලයා (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) ගෙන් විමසූ බවත්, එවිට ඔහු දැක්කේ නැහැ කියා තමාට පැවසූ බවත්, එවිට තමා "හරි කමක් නැහැ මට සැකයක් තියෙනවා එම නිසා යතුරු පැදිය පරීක්ෂා කිරීමට අවශ්‍යයි. කැබින් එක අරින්න" ලෙස ඔහුට දැනුම් දුන් බවත්, එවිට ඔහු "යතුර මා ළඟ නැහැ ඕනනම් හොයාගන්න එකයි ඇත්තේ" යනුවෙන් පැවසූ බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

ඒ සමඟම එම යතුරු පැදියේ පැමිණි මෙම පැමිණිලිකරුගේ බිරිඳ තමා හට බැන වදිමින් "ඔයා කොහොමද තනියම රාජකාරි කරන්නේ, එහෙම නීතියක් තියෙනවද වාහන පරීක්ෂා කරන්න, ඔයාට අයිතියක් තියෙනවද?" කියා බැන වැදුනු බවත්, එවිට තමා නීත්‍යානුකූල රාජකාරියක් සිදුකරන බව ඔවුන්ට පැවසූ බවත්, ඒ සමඟම එම නිවස ඇතුලේ සිට පැමිණි තවත් පිරිමි පුද්ගලයෙකු තමා හට බැන වදිමින් ඔහුගේ අතින් තමාගේ බෙල්ලට හා මුහුණ ප්‍රදේශයට පාරවල් කීපයක් ගැසූ බවත්, තමාට පහර දුන් පුද්ගලයා "මේකව ගේ ඇතුලට දාගමු. උඹේ ගෑනි ඇල්ලුවා කියලා කියපන්" යනුවෙන් ද පැවසූ බවත්, ඒත් සමඟම මෙම පැමිණිලිකරු තම වම් අතින් තදින් අල්ලාගත් බවත්, ඔහුගේ බිරිඳ තම නිල ඇඳුමේ කමිස කොලරයෙන් හා බෙල්ලෙන් අල්ලාගෙන මිදුලේ සිට ඔවුන්ගේ නිවස ඉදිරිපිට උළුවස්ස ළඟට ඇද ගෙන ගිය බවත් 1වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

එම අවස්ථාවේ දී තමාව රඳවාගෙන තම ජීවිතයට හෝ ශරීරයට හානියක් කරයි කියා තමා හට බියක් ඇතිවූ බවත්, එම නිසා ඔවුන්ගෙන් බේරීමට තමා වම් අත ගසා දමා මුදවාගෙන වම් අත අල්ලා සිටි මෙම පැමිණිලිකරුගේ මුහුණ ස්පර්ශ කරමින් ඔහුව තල්ලුකළ බවත්, එවිට ඔහුගේ නළල නිවසේ උළුවස්සේ වැදී තුවාලයක් සිදු වී ලේ ගලනවා තමා දුටු බවත්, තමා ඔවුන්ගෙන් මිදී පාරට දිව ගිය බවත්, තමා පාරට යන විට ශබ්දය ඇසී අසල්වාසීන් කිහිපදෙනෙකු පැමිණ සිටි බවත්, ඔවුන් තමාව

බේරාගත් බවත්, එම නිවස තුළ සිටි පිටස්තර පුද්ගලයා තමාට පහර දීමට පාර දෙසට ආ බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

පසුව පැමිණිලිකරුට තුවාල සිදු වී තිබූ බැවින් ඔවුන් ගෙන්වාගත් ත්‍රීරෝද රථයකින් රෝහලට රැගෙන ගිය බවත්, තමා එම අවස්ථාවේම දුරකථන ඇමතුමක් ගෙන වැඩ බලන ස්ථානාධිපති පො.ප. සමරසිංහ මහතාට දුරකථනයෙන් මේ පිළිබඳව දැනුවත් කළ බවත්, එම අවස්ථාවේම එම මහතා හා නිලධාරීන් කණ්ඩායමක් ජීප් රථයෙන් පැමිණ තමාගෙන් තොරතුරු විමසූ බවත්, එවිටම අපරාධ අංශයේ ස්ථානාධිපති උ.පො.ප. දිසානායක මහතාද පැමිණි බවත්, එතැනදී තමාගෙන් කටඋත්තර ගෙන තමාට පහරදුන් පිරිමි පුද්ගලයා අත්අඩංගුවට ගෙන තිබූ බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත. එසේම, තමා යතුරු පැදියෙන් ඉඟිණියාගල රෝහලට ගොස් ප්‍රතිකාර ලබා ගත් බවත්, තම මුහුණ හා බෙල්ල ඉදිමී තිබූ බවත්, බෙල්ලට පහලින් සීරීම් තුවාල කීපයක් තිබූ බවත්, තමා ඔවුන්ට කිසිදු පහරදීමක් සිදු නොකළ බවත්, රාජකාරියට බාධා කරමින් තමා හට පහරදීම නිසා ඔවුන්ගෙන් බේරීමට සිදුකළ තල්ලුකිරීම නිසා පැමිණිලිකරුගේ නළල උළුවස්සේ වැදුනු බවත්, පහරදුන් බවට සිදු කර ඇති චෝදනාව තමා ප්‍රතික්ෂේප කරන බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

මෙම යතුරු පැදිය නැවැත්වීමට තමා සංඥා කරන අවස්ථාවේ තමා අසල අභයපුර ගමේ පදිංචි සිවිල් ආරක්ෂක බලකායේ විශ්‍රාමික පුද්ගලයකුද සිටි බවත්, ඔහුගේ නම තමා දන්නේ නැති බවත්, පසුව ඔහු පදිංචි නිවස වෙත ශබ්දය ඇසී පැමිණ සිටි බවත්, තමාගේ නිල ඇඳුමින් ඇදගෙන යාමට උත්සහ කරන විට ඔහු එය දකින්න ඇති කියා තමා විශ්වාස කරන බවත්, මෙම පැමිණිල්ලේ සඳහන් වන්නේ පැමිණිලිකරු හා බිරිඳ පමණක් යතුරු පැදියේ පැමිණි බව වුවද තවත් කාන්තාවක් මෙම යතුරු පැදියේ පැමිණි බව තමා දුටු බවත්, ඔවුන්ගේ නිවසේ සිට පැමිණ තමා හට පහරදුන් පුද්ගලයා පිළිබඳව සඳහන් කර නොමැති බවත්, මෙම පැමිණිල්ල මගින් සිදු වූ සිද්ධියට වඩා සිද්ධියක් නිර්මාණය කර ඇති පැමිණිල්ලක් බවට තමා යෝජනා කරන බවත්, එදින තමා බීමත්ව සිටිය බවට පැමිණිල්ලේ සඳහන් කර ඇතත් බීමත්ව නොසිටි බවත් 1 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

<u>2 වන වගඋත්තරකාර ඉඟිණියාගල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. ජයවීර යන අයගේ කරුණු දැක්වීම</u>

පැමිණිල්ලේ 2 වන වගඋත්තරකාර ඉඟිණියාගල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. ජයවීර මහතා විසින් අංක OW/2416/2024 සහ 2024.09. දින රහිත වාර්තාවක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එකී වාර්තාවේ දැක්වෙන්නේ ඉඟිණියාගල පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කරනු ලබන පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා පුද්ගලික යතුරු පැදියෙන් 2024.07.20 වන දින දිවා මුර සංචාරයේ ගොස් අභයපුර ග්‍රාමසේවා වසමේ සංචාරය කරමින් සිටියදී පැය 15.30 ට පමණ අභයපුර හංදිය අසල රැඳී සිටියදී පරගහකැලේ දෙස සිට ඔහු දෙසට ස්කූටි වර්ගයේ යතුරු පැදියක හිස් වැසුම් නොමැතිව පුද්ගලයකු කාන්තාවන් දෙදෙනෙකු සමගින් පැමිණ ඇති බවත්, එම යතුරු පැදිය

නතර කරන ලෙසට සංඥා කළ ද යතුරු පැදිය නොනවත්වා නිලධාරියා පසුකරමින් ගම්මානයට ඇති මාර්ගයේ ධාවනය කර ඇති බවත්, නිලධාරියා තම යතුරු පැදියෙන් එම යතුරු පැදිය පසුපස හඹා ගොස් ඇති බවත්, අභයපුර හංදියේ සිට මීටර් 150ක් පමණ දුරට ධාවනය කළ යතුරු පැදිය මාර්ගයේ දකුණු පස ඇති නිවසක නතර කර ඇති බවත්, නිලධාරියාද එම නිවසට ගොස් එම පුද්ගලයන් හට කතා කර එම යතුරු පැදිය පරීක්ෂා කිරීමට අවශ්‍ය බව පවසා ස්කූටි යතුරු පැදියේ ස්විච් යතුර ඉල්ලා ඇති බවත් ය.

එසේම, එම යතුරු පැදියේ ගමන්කළ පැදිකරු හා එක් කාන්තාවක් නිලධාරියා හට බැණවැදීමත් සමඟම බහින් බස් වීමක් ඇති වී පසුව එකී පැදිකරු සහ කාන්තාව නිලධාරියාගේ අත් දෙකෙන් අල්ලාගෙන නිවස ඇතුලට ඇදගෙන යාමට උත්සහ කර ඇති බවත්, එවිට නිවස තුළ සිට පැමිණි පුද්ගලයකු එකවරම නිලධාරියාගේ බෙල්ල ප්‍රදේශයට හා මුහුණට අතින් පහර දී ඇති බවත්, එයින් බේරීමට නිලධාරියා විසින් ඔහුව අල්ලාගෙන සිටි පැදිකරුව තල්ලු කර දමා ඇති බවත්, එම තල්ලු කිරීමෙන් නිලධාරියාව අල්ලාගෙන සිටි පැදිකරු (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) විසිවී ගොස් එම පුද්ගලයාගේ ඔලුව නිවසේ උළුවස්සේ වැදී තුවාල වී ඇති බවත්, එම අවස්ථාවේ ඇති වූ ඝෝෂාකාරී තත්ත්වය හේතුවෙන් අසල්වැසියන් ද එම ස්ථානයට පැමිණ ඇති අතර එම අවස්ථාවේ නිලධාරියා බේරී මාර්ගය දෙසට පැමිණ ඇති බවත් 2 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

තවද, මෙම අපරාධය වාර්තා වූ පසු තමාගේ ස්ථානයේ නිලධාරින් විසින් අදාල ස්ථානයට ගොස් විමර්ශන කටයුතු පවත්වා නඩු භාණ්ඩ හා සැකකරුවන් වන (1) කෝනාර මුදියන්සේලාගේ සමීර සම්පත් ගුණතිලක (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරුගේ ඥාතියෙක්) (2) අලුත් ගෙදර සනත් ප්‍රියන්ත දිසානායක (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) හා (3) වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරුගේ බිරිඳ) අත්අඩංගුවට ගෙන 2024.07.21 දින අම්පාර ම/උ බී. 5878/24 යටතේ ගරු අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත්, ඉහත සිද්ධියට අදාල සැකකරුවන් වන (1) කෝනාර මුදියන්සේලාගේ සමීර සම්පත් ගුණතිලක යන අයට හා (3) වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී යන අයට ඇප නියම කර සැකකරු (2) අලුත් ගෙදර සනත් ප්‍රියන්ත දිසානායක යන අය 2024.07.25 දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලද බවත්, 2024.07.23 වන දින මෙම සැකකරු සම්බන්ධව මෝසමක් මගින් ගරු අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුව එදින සැකකරු (2) අලුත් ගෙදර සනත් ප්‍රියන්ත දිසානායක (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) යන අය ඇප මත මුදා හැර ඇති බවත්, විමර්ශනයේදී මෙම පැමිණිල්ලට අනුව අමානුෂික ලෙස පහරදීමක් සම්බන්ධව කරුණු අනාවරණය නොවන බවත් 2 වන වගඋත්තරකරු සිය වාර්තාව තුළින් වැඩිදුරටත් දක්වා ඇත.

<u>නිරීක්ෂණ</u>

පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ, 2024.07.20 වන දින ප.ව. 5.00ට පමණ තමා කුලී වැඩ අවසන්කර තම බිරිඳ වන ශ්‍යාමලී ප්‍රියදර්ශනී පැදවූ යතුරු පැදියේ තමා පිටුපසින් වාඩිවී අභයපුර ගමේ තිබෙන

චමින්ද වෙළඳසැල අසලින් නිවස බලා එමින් සිටියදී එම වෙළඳසැල අසල වසම භාර පොලිස් නිලධාරියා වන තමා හොඳින් හඳුනන 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා සිටි බවත්, එවිට තමාට එම නිලධාරියා සුහදශීලී ලෙස අතින් සංඥා කළ බැවින් තමාද ඔහුට අතින් සංඥා කර නිවස බලා ගිය බවත් ය.

1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා විසින් සඳහන් කර ඇත්තේ, 2024.07.20 දින තමා දිවා මුර සංචාරයේ යෙදී සිටියදී එදින පැය 16.00ට ආසන්න වේලාවකදී අභයපුරදී මෙම සිදුවීම සිදු වූ බවත්, තමා අභයපුර පන්සල ඉදිරිපිට ඇති මාර්ගයේ නිල ඇඳුමින් සැරසී සිටියදී යතුරු පැදියකින් පිරිමි පුද්ගලයකු හා කාන්තාවන් දෙදෙනෙකු පරගහකැලේ දෙස සිට හිමිදුරාව දෙසට පැමිණි බවත්, මෙම යතුරු පැදිය පැදවූයේ පිරිමි පුද්ගලයා බවත්, කාන්තාවන් දෙදෙනා පසුපස සිටිය බවත්, ඔවුන් කිසිවෙක් ආරක්ෂක හිස්වැසුම් පැලඳ සිටියේ නැති බවත්, එසේ හෙයින් තමා එම යතුරු පැදිය නවතන ලෙසට දකුණු අත ඍජුව හරහට දමා සංඥා කළ බවත්, පසුව ඔවුන් යතුරු පැදියේ වේගය අඩුකර වම්පසට ගෙන නැවැත්වීමට උත්සහ දරා නැවත වේගය වැඩිකර ඉදිරියට ගිය බවත් ය.

ඉඟිණියාගල පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි තොරතුරු සටහන් 02 පොතේ 2024.07.20 වන දින පැය 10.00ට පිටුව 65 සහ ඡේදය 128 යටතේ යොදා ඇති සටහන අනුව 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා ස්ථානාධිපතිතුමාගේ නියෝග පරිදි දිවා මුර සංචාරය සඳහා පිටත්ව ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු සහ 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බැලීමේ දී පැමිණිලිකරු සිය බිරිඳ සමඟ යතුරු පැදියෙන් ගමන් කරමින් සිටියදී 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා මාර්ගයේ සිට හමු වී ඇති බව පෙනී යයි. එහිදී 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා විසින් යතුරු පැදිය නවත්වන ලෙසට පැමිණිලිකරු හට අතින් සංඥා කළ බවට ප්‍රකාශ කර ඇති අතර, 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා විසින් තමා හට අතින් සංඥා කළ බවට පැමිණිලිකරු ද පිළිගෙන ඇති නමුත්, පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ එකී සංඥාව 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා, පැමිණිලිකරුව ඊට පෙර සිට දන්නා බැවින් ඔහුට සිදු කළ සුහද සංඥාවක් මිස යතුරු පැදිය නවත්වන ලෙසට සිදු කළ සංඥාවක් නොවන බවයි.

එලෙස 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා විසින් සංඥාවක් සිදු කළ බවට පැමිණිලිකරු විසින් පිළිගෙන ඇති බැවින් ද, පැමිණිලිකරු නිවසට පැමිණෙන විටම 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා ද ඔහුගේ යතුරු පැදියෙන් පැමිණිලිකරුගේ යතුරු පැදිය ලුහුබැඳ පැමිණිලිකරුගේ නිවසට පැමිණ ඇති බැවින් ද, පැමිණිලිකරු අණ නොතකා යතුරු පැදිය ධාවනය කිරීම හේතුවෙන් ඔහුගේ නිවසට පැමිණි බවට 1 වන වගඋත්තරකාර පො.කො.

91267 බණ්ඩාර නිලධාරියා විසින් සිදු කර ඇති ප්‍රකාශය පිළිගැනීමේ වැඩි සම්භාවිතාවයක් පවතින බව නිරීක්ෂණය වේ.

එසේම, නිවසට පැමිණි පසු තම බිරිඳ යතුරුපැදියෙන් බැස ඒමට උත්සහ කරන විටම ඉහත සඳහන් කළ 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා ද නිවස අසලට පැමිණි බවත්, එකී නිලධාරියා තම බිරිඳගේ අතින් අදිනු දැක තමා ඒ පිළිබඳව විමසූ බවත්, එවිට 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා අසභ්‍ය වචනයෙන් බැන වදිමින් තමාට පහර දුන් බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ, අදාළ යතුරු පැදියෙන් නීති විරෝධී මත්පැන් හෝ වෙනත් නීතිවිරෝධී ද්‍රව්‍යයක් රැගෙන යන බවට මතු වූ සැකය මතය අදාළ නිවස වෙත ලුහුබැඳ ගොස් යතුරු පැදිය පරීක්ෂා කිරීමට අවශ්‍ය බවට පැමිණිලිකරුට දැනුම් දුන් බවයි. එසේම, 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරුට පහරදීමක් සිදුනොකළ බවත්, පැමිණිලිකරු සහ ඔහුගේ නිවසේ සිටි අය විසින් තමාට සිදුකළ පහරදීමෙන් බේරීමට තල්ලු කරන විට පැමිණිලිකරුව උළුවස්සේ වැදුනු බවත්, එම අවස්ථාවේ පැමිණිලිකරුගේ හිසෙන් ලේ ගලනවා තමා දුටු බවත් ය. එම සිදුවීමෙන් අනතුරුව 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා විසින් දුරකථන ඇමතුමක් මගින් ඉඟිණියාගල පොලිස් ස්ථානය වෙත අදාළ සිදුවීම පිළිබඳව දැනුම් දී පොලිස් නිලධාරීන් එම ස්ථානයට කැඳවා ඇති බව නිරීක්ෂණය වේ.

මෙම සිදුවීමට අදාළව පැමිණිලිකරු, ඔහුගේ බිරිඳ සහ පැමිණිලිකරුගේ නිවසේ සිට ඥාතියෙකු ඉඟිණියාගල පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගෙන ඇත. ඔවුන් අත්අඩංගුවට ගෙන ඇත්තේ රජයේ සේවකයෙකු වන 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියාගේ රාජකාරියට බාධා කිරීම යන චෝදනාව මත ය. දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා, පැමිණිලිකරුගේ නිවසට පැමිණි පසු ඔවුන් අතර බහින්බස්වීම් සහ පහරදීම් සිදුවී ඇති බව නිරීක්ෂණය වේ. මෙම සිදුවීමට අදාළව ඉඟිණියාගල පොලිස් ස්ථානය මගින් සාක්ෂි වශයෙන් පුද්ගලයින් දෙදෙනෙකුගේ ප්‍රකාශ සටහන් කරගෙන ඇත.

ඒ අනුව 2024.07.21 වන දින පැය 16.25ට උ.පො.ප. දිසානායක නිලධාරියා විසින් ආරච්චි හාමිලාගේ දයාරත්න යන අයගේ ප්‍රකාශය පහත පරිදි සටහන් කරගෙන ඇත.

"මා 1971.09.01 වන දින උපත ලැබූ අතර මා පලමු වසරේ සිට අ.පො.ස සා/පෙළ දක්වා පරගහකැලේ විද්‍යාලයෙන් ඉගෙනුම ලැබුවා. මා පාසල් වියෙන් සමුගෙන ගොවිතැන් කටයුතු කරමින් සිටියදී 2000.04.01 දින සිවිල් ආරක්ෂක නිලධාරියකු ලෙස සේවයට ඇතුලත් වී මේ දක්වා සිවිල් ආරක්ෂක නිලධාරියකු ලෙස කටයුතු කරමින් සිටිනවා. මා 2024.07.20 දින උදේ කාලයේ කුඹුරේ වැඩ කර සවස 04.00 ට පමණ අබේපුර බෝගස් හංදියේ සිටියදි ඉගිණියාගල පොලිසියේ අපේ ගමේ

වසම භාර පොලිස් නිලධාරි බංඩාර නිලධාරි මහතා හමු වී ප්‍රජා පොලිස් සම්බන්ධයෙන් කතා කරමින් සිටියා. ඒ අවස්ථාවේ යාය පාර දෙසට ස්කූටි යතුරු පැදියක් සනත් යන අය හා පිටුපස ඔහුගේ බිරිඳ හා තවත් ගැණු ළමයෙක් හෙල්මට් නැතිව ගමන් කරමින් සිටියදී බංඩාර රාළහාමි යතුරු පැදිය නතර කරන ලෙසට සංඥා කළා. ඒ අවස්ථාවේ යතුරු පැදිය නතර නොකර ඔහුගේ නිවස දෙසට ගමන් කළා. බංඩාර රාළහාමිද ඔහුගේ යතුරු පැදියෙන් ඒ දෙසට ගමන් කළා. ඊට ටික වේලාවකින් සනත්ගේ ගෙදර කලබලයක් බව මට දැනගන්න ලැබුණා. මා ඒ දෙසට යමින් සිටියදි සනත් සහ ඔහුගේ බිරිද බංඩාර රාළහාමි අල්ලාගෙන නිවස තුලට ඇදගෙන යන්න උත්සහ කළා. මා ඒ අවස්ථාවේ සනත්ට හා ඔහුගේ බිරිඳට කිව්වා මොනවද උඹලා ඔය යුනිෆෝම් ඇදගෙන ඉන්න නිලධාරියෙක් අල්ලාගෙන ඉන්නේ අත ඇරපල්ලා කියලා. ඊට පසු බංඩාර රාළහාමි අත උදුරාගෙන පාර දෙසට දිව ගියා. ඒ අවස්ථාවේ සනත්ගේ නළල දෙසින් ලේ ගලමින් තිබුණා. බංඩාර රාළහාමිගේ අතින් සනත් අල්ලගෙන සිටියදි ඉන් මිදීම සඳහා දගලන විට සනත්ගේ නළල උළුවස්සේ වැදුන බව මා පසුව දැනගත්තා.”

ඒ අනුව 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියාව පැමිණිලිකරු සහ ඔහුගේ බිරිඳ අතින් ඇදගෙන යාමට උත්සහ කළ බව තමා දුටු බවට ආරච්චිහාමිලාගේ දයාරත්න යන අය ප්‍රකාශ කර ඇත. එබැවින් 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියාගේ රාජකාරියට බාධා කිරීමට පැමිණිලිකරු සහ ඔහුගේ බිරිඳ උත්සහ දැරූ බව එකී ප්‍රකාශයෙන් පෙනී යයි. එහෙත් ආරච්චිහාමිලාගේ දයාරත්න යන අය 2025.04.24 වන දිනැතිව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය මගින් ප්‍රකාශ කර ඇත්තේ, තමා පැමිණිලිකරුගේ නිවස ආසන්නයේ නිවසක සිටියදී පැමිණිලිකරුගේ නිවස දෙසින් කෑගසන ශබ්දයක් ඇසුණු බැවින් යම්කිසි කරදරයක් සිදුව ඇත් ද යන්න බැලීමට තමා එහි ගිය බවත්, එවිට පැමිණිලිකරුගේ මිදුලේ පොලිස් නිලධාරියෙකු සිටි බවත්, තමාව දුටු විට “මාමේ මේ රාළහාමි මට ගැහුවා” යනුවෙන් පැමිණිලිකරු ප්‍රකාශ කළ බවත්, පැමිණිලිකරුගේ නළලින් ලේ ගලන බව තමා දුටු බවත්, එම අවස්ථාවේ එම ස්ථානයට රැස්ව සිටි පිරිස කෑගසමින් සිටි නිසා ඔවුන් ආරවුලක් ඇති කරගනු ඇතැයි සිතා තමා පොලිස් නිලධාරියා රැගෙන නිවස ඉදිරිපිට කොන්ක්‍රීට් පාරට ගිය බවත් ය.

ඒ අනුව ආරච්චිහාමිලාගේ දයාරත්න යන අය විසින් ඉඟිණියාගල පොලිස් ස්ථානය වෙත ලබාදුන් ප්‍රකාශයෙහි ඇතුළත් කරුණු වලට වඩා හාත්පසින්ම වෙනස් වූ කරුණු ඇතුළත් දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති බව පෙනී යයි. ආරච්චිහාමිලාගේ දයාරත්න යන අය විසින් ඉඟිණියාගල පොලිස් ස්ථානය වෙත ලබාදුන් ප්‍රකාශයෙහි පැමිණිලිකරු, ඔහුගේ බිරිඳ සහ තවත් ගැහැණු දරුවෙකු සමඟ ස්කූටි යතුරු පැදියකින් හෙල්මට් නැතිව ගමන් කරමින් සිටියදී 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා යතුරු පැදිය නතර කරන ලෙසට සංඥා කළ බවත්, ඒ අවස්ථාවේ යතුරු පැදිය නතර නොකර පැමිණිලිකරු ඔහුගේ නිවස දෙසට ගමන් කළ බවත්, 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා ද ඔහුගේ යතුරු පැදියෙන් ඒ දෙසට ගමන් කළ බවත් සඳහන් කර ඇත. ඒ සියල්ල තමා 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර

නිලධාරියා සමඟ මාර්ගයේ කතා කරමින් සිටියදී දුටු බවට ආරච්චිහාමිලාගේ දයාරත්න යන අය විසින් ඉඟිණියාගල පොලිස් ස්ථානය වෙත ප්‍රකාශ කර ඇත.

එහෙත් එලෙස පැමිණිලිකරු, 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියාගේ සංඥාව නොතකා යතුරු පැදිය ඔහුගේ නිවස දෙසට ධාවනය කළ බැවින් 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා ඔහුගේ යතුරු පැදියෙන් පැමිණිලිකරුගේ නිවස දෙසට ගමන් කළ බව තමා දුටු බවක් ආරච්චිහාමිලාගේ දයාරත්න යන අය විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශයෙහි සඳහන් කර නැත. එකී දිවුරුම් ප්‍රකාශයෙහි සඳහන් කරුණු අනුව ආරච්චිහාමිලාගේ දයාරත්න යන අය පැමිණිලිකරුගේ නිවස ආසන්නයේ පිහිටි ඔහුගේ ඥාතියෙකුගේ නිවසක සිටි අවස්ථාවේ පැමිණිලිකරුගේ නිවස දෙසින් ඇසුණු කෑගැසීම් ශබ්දයක් හේතුවෙන් කරදරයක් සිදු වී ඇත්ද යන්න බැලීම සඳහා පැමිණිලිකරුගේ නිවසට ගොස් ඇත. එහිදී ඔහු සඳහන් කර ඇත්තේ "...එම නිවස වෙත යන විට දුටුවා මීදුලේ පොලීසියේ මහත්තයෙක් ඉන්නවා" යනුවෙනි. ඉඟිණියාගල පොලිස් ස්ථානය වෙත ලබා දුන් ප්‍රකාශයෙහි ඇතුළත්ව තිබූ පරිදි එකී පොලිස් නිලධාරියාව මාර්ගයේ දී හමු වූ බව හෝ ඔහු සමඟ කතාබහ කරමින් සිටි බව හෝ එකී පොලිස් නිලධාරියා පැමිණිලිකරුගේ යතුරු පැදිය පිටුපසින් ඔහුගේ යතුරු පැදියෙන් පැමිණි බව තමා දුටු බව හෝ ආරච්චිහාමිලාගේ දයාරත්න යන අය කොමිෂන් සභාව වෙත ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශයෙහි සඳහන් කර නැත. ඒ අනුව ආරච්චිහාමිලාගේ දයාරත්න යන අය, ඉඟිණියාගල පොලිස් ස්ථානය වෙත ලබා දුන් ප්‍රකාශයෙහි ඇතුළත් කරුණු සහ කොමිෂන් සභාව වෙත ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශයෙහි සඳහන් කරුණු එකිනෙක පරස්පර විරෝධී වන බව නිරීක්ෂණය වේ.

එසේම, ආරච්චිහාමිලාගේ දයාරත්න යන අය ඉඟිණියාගල පොලිස් ස්ථානය වෙත ප්‍රකාශ කර ඇත්තේ, "සනත් (පැමිණිලිකරු) සහ ඔහුගේ බිරිඳ බංඩාර රාළහාමි අල්ලාගෙන නිවස තුළට ඇදගෙන යන්න උත්සහ කළා. මා ඒ අවස්ථාවේ සනත්ට හා ඔහුගේ බිරිඳට කිව්වා මොනවද උඹලා ඔය යුනිෆෝම් ඇඳගෙන ඉන්න නිලධාරියෙක් අල්ලාගෙන ඉන්නේ අත ඇරපල්ලා කියලා. ඊට පසු බංඩාර රාළහාමි අත උදුරාගෙන පාර දෙසට දිව ගියා" යනුවෙනි. එහෙත් එලෙස පැමිණිලිකරු සහ ඔහුගේ බිරිඳ, 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියාව නිවස තුළට ඇදගෙන යාමට උත්සහ කළ බව තමා දුටු බවට කොමිෂන් සභාව වෙත ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශයෙහි සඳහන් නොවේ. එහි සඳහන්ව ඇත්තේ "...මේ වන විට එතනට රැස්ව සිටි තරුණ පිරිස කෑකොගසමින් සිටි නිසා රණ්ඩු කරගතැයි සිතූ මා පොලීසියේ රාළහාමිව රැගෙන නිවස ඉදිරිපිට කොන්ක්‍රීට් පාරට ගියා" යනුවෙනි. එකී කරුණු අනුව එම අවස්ථාවේ දී පොලිස් නිලධාරියා සමඟ කිසිවෙකු ආරවුලක් ඇති කරගෙන නොමැති බවත්, එසේ සිදුවේය යන පූර්වානුමානය මත පොලිස් නිලධාරියාව එම ස්ථානයෙන් රැගෙන යාමට කටයුතු කර ඇති බවත් පෙනී යයි. කෙසේ වෙතත් මෙම කරුණු අනුව ද පෙනී යන්නේ ආරච්චිහාමිලාගේ දයාරත්න යන අය, ඉඟිණියාගල පොලිස් ස්ථානය වෙත ලබා දුන් ප්‍රකාශයෙහි ඇතුළත් කරුණු සහ කොමිෂන් සභාව වෙත ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශයෙහි සඳහන් කරුණු එකිනෙක පරස්පර විරෝධී වන බවයි.

සමස්තයක් ලෙස සලකා බැලීමේ දී ආරච්චිහාමිලාගේ දයාරත්න යන අය, ඉඟිණියාගල පොලිස් ස්ථානය වෙත ලබා දුන් ප්‍රකාශයෙහි ඇතුළත් කරුණු වන තමා 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියාව මාර්ගයේ දී හමු වී කතබහ කරමින් සිටි බව, එම අවස්ථාවේ දී පැමිණිලිකරු, ඔහුගේ බිරිඳ සහ තවත් ගැහැණු දරුවෙකු සමඟ ස්කූටි යතුරු පැදියකින් හෙල්මට් නැතිව ගමන් කරමින් සිටියදී 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා යතුරු පැදිය නතර කරන ලෙසට සංඥා කළ බව තමා දුටු බව, පැමිණිලිකරු යතුරු පැදිය නතර නොකොට ධාවනය කළ බැවින් 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා ද ඔහුගේ යතුරු පැදියෙන් පැමිණිලිකරුගේ යතුරු පැදිය පසුපස ගමන් කළ බව තමා දුටු බව, ඉන් ටික වේලාවකට පසුව පැමිණිලිකරුගේ නිවසේ කලබලයක් බව දැනගෙන තමා එම නිවසට ගිය බව සහ එම අවස්ථාවේ දී 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියාව පැමිණිලිකරු සහ ඔහුගේ බිරිඳ අතින් ඇදගෙන යාමට උත්සහ කළ බව තමා දුටු බව යන කිසිවක් ආරච්චිහාමිලාගේ දයාරත්න යන අය කොමිෂන් සභාව වෙත ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශයෙහි ඇතුළත් නොවන බව පෙනී යයි. එකී දිවුරුම් ප්‍රකාශය මගින් ඉඟිණියාගල පොලිස් ස්ථානය විසින් ආරච්චිහාමිලාගේ දයාරත්න යන අයගෙන් සටහන් කරගෙන ඇති ප්‍රකාශයට සම්පූර්ණ වෙනස් කරුණු අනාවරණය වන බව පෙනී යයි.

තවද, 2024.07.21 වන දින පැය 16.25ට උ.පො.ප. දිසානායක නිලධාරියා විසින් දිසානායක මුදියන්සේලාගේ කසුනි දිල්රුක්ෂි යන අයගේ ප්‍රකාශය පහත පරිදි සටහන් කරගෙන ඇත.

"මා 2007 වසරේ අම්පාර රෝහලේ උපත ලැබූ අතර පළමු වසරේ සිට මේ දක්වා අබේපුර විද්‍යාලයෙන් ඉගෙනීම් කටයුතු සිදු කරමින් සිටිනවා. මගේ පියා නිලන්ත පුෂ්ප කුමාර යන අයයි. මගේ මව හදිසි හෘදයාබාදයකින් මිය ගොස් සිටින අතර පියා නිවසින් බැහැරව යන අවස්ථා වලදී මගේ ආරක්ෂාව සඳහා මා සනත් මාමාලාගේ ගෙදර නතර කරලයි යන්නේ. සනත් මාමාගේ දියණිය වන දිලිනි යන අය ද මගේ හිතවත් මිතුරියක්. ඒ අනුව 2024.07.20 වන දින මාගේ පියාට ගමනක් යාමට ඇති බැවින් එදින උදේ පැය 0900 ට පමණ මගේ පියා මාව දිලිනිලාගේ ගෙදරට යතුරු පැදියෙන් ගෙනවිත් ඇරලුවා. ඊට පසු දිවා ආහාර ගැනීමෙන් පසු සනත් මාමායි දිස්නා නැන්දයි මමයි සනත් මාමලාගේ කුකුල් කූඩුවට කෑම දැමීම සඳහා සනත් මාමාගේ යතුරු පැදියෙන් පිටව ගියා. අපි කුකුලන් සඳහා කෑම වතුර ලබා දී එම යතුරු පැදියෙන්ම සනත් මාමායි. මමයි නැන්දයි ගෙදර ඒමට පිටත් වුනා. ඊට පසු අපි ගෙදර මිදුලට පැමිණ යතුරු පැදිය නතර කළා. ඊට පසුව මා ටොයිලට් එකට ගියා. ටොයිලට් එකට ගොස් ආපසු එමින් සිටියදී සනත් මාමගේ නලල පැලිලා ලේ ගලමින් සිටිනවා මා දැක්කා. ඊට පසු මා අප්පච්චිට කෝල් එකක් ගත්තා. අප්පච්චි ආවට පස්සේ නැවත ගෙදරට ගොස් ආපහු සනත් මාමාලාගේ ගෙදරට ඇවිල්ලා හිටියා. ප්‍රශ්නය:- ඔබ එදින සනත් මාමාගේ යතුරු පැදියෙන් පැමිණි අවස්ථාවේ අහේපුර පන්සල අසල බෝගස් හංදියේ නිල ඇඳුමින් පොලිස් නිලධාරියකු සිටිනවා දුටුවාද? උත්තරය :- නැත. ප්‍රශ්නය :- ඔබ සනත් මාමාගේ නිවසට යතුරු

පැදියෙන් ගොස් ටොයිලට් එකට ගොස් නැවත පැමිණි අවස්ථාවේ සනත් මාමාගේ නිවස ඉදිරිපිට හෝ ඒ ආසන්නයේ නිල ඇඳුමින් පොලිස් නිලධාරියකු සිටිනවා දුටුවාද? උත්තරය :- පොලිස් නිලධාරියකු සනත් මාමාගේ මිදුලේ සිටිනවා දැක්කා. ප්‍රශ්නය:- එදින කුමන හෝ අවස්ථාවක නිල ඇඳුමින් සිටි පොලිස් නිලධාරියකු සනත් මාමාට පහර දෙනවා දැක්කාද? උත්තරය :- නැත."

ඒ අනුව ඉඟිණියාගල පොලිස් ස්ථානය මගින් පැමිණිලිකාර පාර්ශවයට එරෙහිව 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියාගේ රාජකාරී කටයුතු සඳහා පැමිණිලිකාර පාර්ශවය විසින් බාධාවක් සිදු කළ බවට නඩු පැවරීමේ දී සාක්ෂි ලෙස දිසානායක මුදියන්සේලාගේ කසුනි දිල්රුක්ෂි යන අයගේ ප්‍රකාශය ද පාදක කරගෙන තිබුණ ද එම ප්‍රකාශය තුළින් 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියාගේ රාජකාරී කටයුතු සඳහා පැමිණිලිකාර පාර්ශවය විසින් බාධාවක් සිදු කළ බවට අනාවරණය නොවන අතර, දිසානායක මුදියන්සේලාගේ කසුනි දිල්රුක්ෂි යන අයගේ ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරුගේ මිදුලේ පොලිස් නිලධාරියෙකු සිටි බවට තමා දුටු බව පමණි.

කෙසේවෙතත් ඉහත කී ආරච්චි හාමිලාගේ දයාරත්න යන අය පොලිස් ස්ථානය වෙත ලබා දී ඇති ප්‍රකාශය, ඔහුගේ දිවුරුම් ප්‍රකාශය සහ දිසානායක මුදියන්සේලාගේ කසුනි දිල්රුක්ෂි යන අය පොලිස් ස්ථානය වෙත ලබා දී ඇති ප්‍රකාශය අනුව 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා පැමිණිලිකරුගේ නිවසට පැමිණ සිට ඇති බවත්, එම අවස්ථාවේදී පැමිණිලිකරු තුවාල ලබා සිට ඇති බවත් තහවුරු වේ. එසේවුවද, 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නිලධාරියා රාජකාරී කටයුතු සඳහා පැමිණිලිකාර පාර්ශවය විසින් බාධාවක් සිදු කළ බවට තහවුරු වන ආකාරයේ ප්‍රබල සාක්ෂියක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී නොමැති නමුත්, එවැන්නක් සිදු නොවූ බවට තහවුරු වන ආකාරයේ ප්‍රබල සාක්ෂියක් ද ඉදිරිපත් වී නොමැත. එසේ හෙයින් පැමිණිලිකරු අත්අඩංගුවට පත්වන අවස්ථාවේදී ඒ සඳහා සාධාරණ හේතුවක් තිබුණේද යන්න නිශ්චිතව නිගමනය කළ නොහැකි ය. එසේම, මීට අදාළව අම්පාර මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී 5878/24 දරණ නඩුව මේ වන විට විභාග වෙමින් පවතී.

මෙම පැමිණිල්ලට අදාළව සිදුව ඇති පහරදීම් සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ඊට අදාළ වෛද්‍ය වාර්තා වැදගත්ම සාක්ෂියක් වශයෙන් සැලකිය හැකි ය. අදාළ සිදුවීම සිදුවූ 2024.07.20 වන දින ප.ව.17.14ට පැමිණිලිකරු අම්පාර රෝහල රෝහල වෙත ඇතුළත් වී ඇති බවත්, අධිකරණ වෛද්‍යවරයා විසින් ඔහුව 2024.07.21 වන දින පෙ.ව. 10.15ට පරීක්ෂා කර ඇති බවත් පැමිණිලිකරුගේ අංක 1086/24 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව නිරීක්ෂණය වේ. එසේම, එකී අධිකරණ වෛද්‍ය වාර්තාවේ පැමිණිලිකරුගේ ශරීරයේ වූ තුවාල පහත පරිදි සටහන් කර ඇත. ඒවානම්,

1. A laceration measuring 0.5cm x 4cm is noted on the forehead, 1cm above the inner edge of the left eyebrow.

2. An abrasion measuring 0.5cm x 0.5cm is noted on the tail of the left eyebrow.

3. According to the ENT examination by ENT surgeon, there is traumatic perforation of the right ear tympanic membrane along with moderate sensory neural hearing impairment in the right ear.

මෙම තුවාල අතරින් අංක 1 සහ 2 තුවාල බරපතල නොවන තුවාල වන බවත්, 3 වන තුවාලය බරපතල තුවාලයක් බවත් අධිකරණ වෛද්‍යවරයා විසින් සඳහන් කර ඇත. තවද, මෙම තුවාල සම්බන්ධයෙන් වන අධිකරණ වෛද්‍යවරයාගේ මතය පහත පරිදි සටහන් කර ඇත.

"Opinions

The examinee reports a history of an assault. There is medical evidence suggesting blunt forced trauma, which is compatible with the reported history.

This patient needs to be reevaluated by an ENT surgeon in a six month period to assess the hearing impairment and his prognosis."

ඒ අනුව මෙම තුවාල මොට ආයුධයකින් සිදු වූ ඒවා බවට යෝජනා කිරීමට වෛද්‍ය සාක්ෂි පවතින බවත්, පැමිණිලිකරු විසින් පහරදීමකට අදාළව ලබා දී ඇති ඉතිහාසය සමඟ ගැළපෙන බවත් අධිකරණ වෛද්‍යවරයා විසින් සඳහන් කර ඇත.

එසේම, පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාවේ "රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය" පහත පරිදි සටහන් කර ඇත. එනම්,

"2024.07.20 වෙනිදා මම මගෙ නෝනා එක්ක මෝටර් බයික් එකේ ගෙදර යන ගමන් හිටියෙ. මගෙ නෝනා බයික් එක පැදගෙන ආවේ. මම පිටිපස්සෙ ඉඳගෙන ආවා. අපේ වසම බාරව ඉන්න බණ්ඩාර කියන පොලිස් මහත්තයා පාරෙ හිටියා. එයා මට අත වැනුවා. මන් හිතුවෙ නිකන් අඳුරන කමට අත වැනුවා කියලා. මන් කලින් ඉඳන් දන්නවා එයාව. ඒත් මගෙ නෝනා එයාව දැකලා නෑ. අපි අපේ ගෙදරටම ගිහින් ගෙට ඇතුල් වෙද්දිම හවස 4 ට විතර, ඒ පොලිසියෙ මහත්තයත් අපෙ ගෙදර ඇවිත්. එයා මගේ දකුණු කනට හයියෙන් ගැහුවා දෙපාරක්. මාව විසි වෙලා ගිහින් නළල උළුවස්සෙ වැදුණා. මාව කලන්තෙ දාලා වැටුණා. දැන් මගෙ දකුණු කන ඇහෙනවා අඩුයි." යනුවෙනි.

ඒ අනුව ඉහත සඳහන් අධිකරණ වෛද්‍යවරයාගේ මතය අනුව පැමිණිලිකරු විසින් "රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය" යටතේ ලබා දී ඇති බණ්ඩාර නම් පොලිස් නිලධාරියා පැමිණිලිකරු හට පහරදුන් බවට වන ප්‍රකාශය, ඔහුගේ ශරීරයේ පවතින තුවාල හා සැසඳෙන බවට අධිකරණ වෛද්‍යවරයා විසින් නිගමනය කර ඇති බව පෙනී යයි.

අදාළ සිදුවීම වූ 2024.07.20 වන දින ප.ව.20.47ට පැමිණිලිකරුගේ බිරිඳ වන වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී යන අය ද අම්පාර රෝහල වෙත ඇතුළත් වී ඇති බවත්, අධිකරණ වෛද්‍යවරයා විසින් ඇයව 2024.07.21 වන දින පෙ.ව. 10.20ට පරීක්ෂා කර ඇති බවත් පැමිණිලිකරුගේ බිරිඳ වන වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී යන අයගේ අංක 1089/24 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව නිරීක්ෂණය වේ. එසේම, එකී අධිකරණ වෛද්‍ය වාර්තාවේ පැමිණිලිකරුගේ බිරිඳ වන වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී යන අයගේ ශරීරයේ වූ තුවාල පහත පරිදි සටහන් කර ඇත. ඒවානම්,

1. An abrasion measuring 1cm x 1cm is noted on the posterior aspect of the upper third of the left forearm.
2. A contusion measuring 2cm x 3cm is noted on the posterior aspect of the upper third of the left forearm.

මෙම අංක 1 සහ 2 තුවාල බරපතල නොවන තුවාල වන බව අධිකරණ වෛද්‍යවරයා විසින් සඳහන් කර ඇත. තවද, මෙම තුවාල සම්බන්ධයෙන් වන අධිකරණ වෛද්‍යවරයාගේ මතය පහත පරිදි සටහන් කර ඇත.

"Opinions

The examinee reports a history of an assault. There is medical evidence suggesting blunt forced trauma, which is consistent with the reported history."

ඒ අනුව මෙම තුවාල මොට ආයුධයකින් සිදු වූ ඒවා බවට යෝජනා කිරීමට වෛද්‍ය සාක්ෂි පවතින බවත්, පැමිණිලිකරුගේ බිරිඳ වන වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී යන අය විසින් පහරදීමකට අදාළව ලබා දී ඇති ඉතිහාසය සමඟ ගැළපෙන බවත් අධිකරණ වෛද්‍යවරයා විසින් සඳහන් කර ඇත.

එසේම, පැමිණිලිකරුගේ බිරිඳ වන වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාවේ "රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය" පහත පරිදි සටහන් කර ඇත. එනම්,

"2024.07.20 වෙනිදා මම මගෙ මහත්තයා එක්ක මෝටර් බයික් එකේ ගෙදර යන ගමන් හිටියෙ. මමයි බයික් එක පැදගෙන ආවේ. මහත්තයා පිටිපස්සෙ ඉඳගෙන ආවා. අපේ වසම බාරව ඉන්න පොලිස් මහත්තයා පාරෙ ඉඳලා. ඒත් මම එයාව දැක්කෙ නෑ. අපි අපේ ගෙදරටම ගිහින් ගෙට ඇතුල් වෙද්දිම හවස 4 ට විතර, ඒ පොලිසියේ මහත්තයත් අපෙ ගෙදර ඇවිත්. එයා මගේ මහත්තයට ගැහුවා. මන් බේරන්න යද්දි මාව තල්ලු කලා, මාව වැටිලා අත වැදුණා." යනුවෙනි.

ඒ අනුව පැමිණිලිකරුගේ බිරිඳ වන වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී යන අය විසින් "රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය" යටතේ ලබා දී ඇති වසම භාරව සිටින පොලිස් නිලධාරියා

එනම්, 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියා පැමිණිලිකරුගේ බිරිඳ වන වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී යන අයව තල්ලු කිරීමෙන් ඇය වැටී අත වැදුණු බවට වන ප්‍රකාශය, ඇයගේ ශරීරයේ පවතින තුවාල හා සැසඳෙන බවට අධිකරණ වෛද්‍යවරයා විසින් නිගමනය කර ඇති බව පෙනී යයි.

එසේම, එම සිද්ධිය සිදුවන අවස්ථාවේ දී නිවසේ සිට ඇති පැමිණිලිකරුගේ දියණිය වන අලුත්ගෙදර දිලිනි තක්ෂිලා දිසානායක යන අය විසින් 2024.08.08 දිනැති දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2024.07.20 වන දින පස්වරු 5.00 තමා නිවසෙහි සාලයෙහි වාඩි වී සිටියදී මව සහ පියා යතුරු පැදියෙන් නිවසට පැමිණි බවත්, තම මව සිය යතුරු පැදිය මිදුලෙහි නවත්වනවාත් සමඟම පොලිස් නිලධාරියෙකු පැමිණ ඔහුගේ යතුරු පැදියද ඔවුන්ගේ මිදුලෙහි නතර කළ බවත්, එම පොලිස් නිලධාරියා යතුරුපැදියෙන් බැස තම මව අතේ තිබූ යතුරු පැදියේ යතුර අතින් උදුරා ගත් බවත්, එවිට තම පියා විසින් එම නිලධාරියාගෙන් ඇයි මහත්තයෝ ඇයි කියා ඇසූ බවත් ය. එවිට එම පොලිස් නිලධාරියා නිවස තුළට ඇතුළු වී පරුෂ වචන පවසා තම පියාගේ ගෙල ප්‍රදේශයෙන් අල්ලාගෙන ඔහුගේ අතින් තම පියාගේ ගෙල ප්‍රදේශයට පහරක් එල්ල කරන ලද බවත්, එවිට තම පියා හට පහර නොදෙන ලෙසට තමා කෑමොර දුන් බවත්, එහෙත් එම පොලිස් නිලධාරියා තවත් පහරක් පියා වෙත එල්ල කරන ලද බවත්, එම පහර හේතුවෙන් තම පියාගේ නළල උළුවස්සේ වැදී නළල ප්‍රදේශය පැලී පියා සිහිසුන්ව ඇද වැටුණු බවත්, තම පියා හට අදාළ පොලිස් නිලධාරියා පහර දුන් අවස්ථාවේ දී ඔහුව බේරා ගැනීමට තම මව ගිය විට ඇයට ද පොලිස් නිලධාරියාගේ පහරවල් වැදුණු බවත් පැමිණිලිකරුගේ දියණිය සිය දිවුරුම් ප්‍රකාශය මගින් දක්වා ඇත. එකී දිවුරුම් ප්‍රකාශය අනුව පැමිණිලිකරු හට 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියා පහර දී ඇති බව නිරීක්ෂණය වේ.

1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියාගේ අංක 87/2024 සහ 2024.07.20 දිනැති අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමයේ සඳහන් කර ඇත්තේ ඔහුගේ ශරීරයේ මොට ආයුධයකින් සිදු වූ බරපතළ නොවන සීරීම් තුවාල ඇති බවයි. කෙසේවෙතත් අධිකරණ වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කර නොමැති බැවින් එකී සීරීම් තුවාල පවතින්නේ ශරීරයේ කෙබඳු ස්ථාන වලද යන්න සහ 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියා පවසන පරිදි ඔහුට පැමිණිලිකරු සහ ඔහුගේ නිවසේ සිට ඥාතියෙකු විසින් සිදු කළ පහරදීම හේතුවෙන් එකී තුවාල ඇති වී තිබෙන බවට වෛද්‍යවරයා නිගමනය කර තිබේ ද යන්න පැහැදිලි කරගැනීමට හැකියාවක් නොමැත. එසේම, එලෙස පහරදීමක් සිදුවූ බවට තහවුරු වන ආකාරයේ වෙනත් කිසිදු සාක්ෂියක් ද ඉදිරිපත්ව නැත.

**නිගමනය**

ඉහත දක්වන ලද සියලු කරුණු අනුව සලකා බැලීමේ දී පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව ඔවුන්ගේ ශරීරයේ පැවති තුවාල 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියා විසින් සිදු කරන ලද පහර දීම් හේතුවෙන් ඇති වූ ඒවා බවට අධිකරණ වෛද්‍යවරයා විසින්

තහවුරු කර ඇත. එසේම, පැමිණිලිකරුගේ බිරිඳ වන වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාවේ රෝගියා විසින් ලබාදෙන කෙටි ඉතිහාසය තුළ සඳහන් කර ඇත්තේ තම ස්වාමිපුරුෂයා වන පැමිණිලිකරුට 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියා විසින් පහරදුන් අවස්ථාවේ දී තමා ඔහුව බේරීමට යාමේ දී 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියා විසින් තමාව තල්ලු කළ බවත්, එවිට තමා වැටී අත වැදුණු බවත් ය. එකී ඉතිහාසය සමඟ ඇයගේ ශරීරයේ තිබූ තුවාල සැසඳෙන බවට අධිකරණ වෛද්‍යවරිය විසින් සඳහන් කර ඇති බැවින් පැමිණිලිකරුගේ බිරිඳ වන වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී යන අය විසින් ප්‍රකාශ කරන ලද ආකාරයේ සිදුවීමක් සිදුව ඇති බව පිළිගත හැකි ය. 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇති පරිදි පැමිණිලිකරු 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියාගේ අතින් අල්ලාගෙන සිටි නිසා නිලධාරියා ඉන් බේරීම සඳහා අත ගසා දැමූ අවස්ථාවේ දී පැමිණිලිකරුගේ හිස නිවසේ උළුවස්සේ වැදී තුවාල වූයේ නම් පැමිණිලිකරුගේ බිරිඳ වන වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී යන අයහට තුවාල සිදු වීමේ හැකියාවක් නොමැත. එබැවින් 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියා විසින් පැමිණිලිකරුට පහරදුන් අවස්ථාවේ දී ඔහුව බේරීමට යාමේ දී 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියා විසින් තමාව තල්ලු කළ බවට පැමිණිලිකරුගේ බිරිඳ වන වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී යන අය සිදු කරන ලද ප්‍රකාශය පිළිගත හැකි එකක් බව ද පෙනී යයි. එසේම, අදාළ සිද්ධිය වන අවස්ථාවේ නිවසේ සිටි පැමිණිලිකරුගේ දියණිය වන අලුත්ගෙදර දිලිනි තක්ෂිලා දිසානායක යන අය විසින් 2024.08.08 දිනැතිව ලබා දී දිවුරුම් ප්‍රකාශය මගින් ද පැමිණිලිකරුට 1 වන වගඋත්තරකාර පො.කො.91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියා විසින් සිදු කරන ලද පහර දීම් තමා දුටු බවත්, එය බේරීමට ගිය විට පැමිණිලිකරුගේ බිරිඳ වන වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී යන අයට ද එම පහරවල් වැදුණු බව තමා දුටු බවත් සඳහන් කර ඇත.

එසේහෙයින් ඉහත කී පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාව, පැමිණිලිකරුගේ බිරිඳ වන වනසිංහ මුදියන්සේලාගේ ශ්‍යාමලී ප්‍රියදර්ශනී යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව සහ පැමිණිලිකරුගේ දියණිය වන අලුත්ගෙදර දිලිනි තක්ෂිලා දිසානායක යන අය විසින් 2024.08.08 දිනැතිව ලබා දී දිවුරුම් ප්‍රකාශය යන සාක්ෂි අනුව 1 වන වගඋත්තරකාර පො.කො.91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියා විසින් පැමිණිලිකරුට පහර දී ඇති බවට තහවුරු වේ.

<u>අමල් සුදත් සිල්වා එ. පොප. කොඩිතුවක්කු</u> (1987) 2 Sri L.R. 119 නඩුවේ දී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව ප්‍රකාරව කිසිම තැනැත්තෙකු වධහිංසාවලට කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවත්, එය කිසිදු සීමාවකට යටත් කර නොමැති මූලික අයිතිවාසිකමක් බවත්, යම් පුද්ගලයෙකු අපරාධකරුවෙකු වුවද මෙම මූලික අයිතිවාසිකම ඔහුට ද එලෙසින්ම අදාළ වන බවත් සඳහන් කර ඇත.

එසේහෙයින් , 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියා විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති කිසිම තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය යන පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, මෙම සිදුවීමට අදාළව පැමිණිලිකරු, ඔහුගේ බිරිඳ, අදාළ සිදුවීම සිදුවන අවස්ථාවේ දී පැමිණිලිකරුගේ නිවසේ සිටි පැමිණිලිකරුගේ ඥාති පුද්ගලයා, 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර නම් පොලිස් නිලධාරියා, ගම්වාසියෙකු වන ආරච්චිහාමිලාගේ දයාරත්න දිසානායක සහ පැමිණිලිකරු සහ ඔහුගේ බිරිඳ සමඟ යතුරු පැදියේ පැමිණ ඇති මුදියන්සේලාගේ කසුනි දිල්රුක්ෂි යන තැනැත්තන්ගෙන් ප්‍රකාශ සටහන් කරගැනීමට ඉඟිණියාගල පොලිස් ස්ථානය විසින් කටයුතු කර ඇති බවත්, මෙම සිදුවීමට අදාළව අංක බී 5878/24 යටතේ අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමට 2 වන වගඋත්තරකාර ඉඟිණියාගල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප.ජයවීර යන අය විසින් කටයුතු කර ඇති බවත් නිරීක්ෂණය වේ. ඒ අනුව පොලිස් ස්ථානය වෙත වාර්තා වූ පැමිණිල්ලට අදාළව විමර්ශනයක් සිදු කර අධිකරණයට කරුණු වාර්තා කර ඇති බැවින් 2 වන වගඋත්තරකාර ඉඟිණියාගල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප.ජයවීර යන අය විසින් නිසි ක්‍රියාපටිපාටිය අනුගමනය කර ඇති බව නිරීක්ෂණය වන බැවින් මෙම පැමිණිල්ලට අදාළව 2 වන වගඋත්තරකාර ඉඟිණියාගල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප.ජයවීර යන අයට වගකීමක් පැවරීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටී.**

1. 1 වන වගඋත්තරකාර පො.කො. 91267 බණ්ඩාර යන අය විසින් රුපියල් දසදහස (රු.10,000/-)ක මුදලක් පැමිණිලිකාර පාර්ශවය වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.
2. 1 වන වගඋත්තරකරු මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2026. ០៦ . 18 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් සහ පොලිස්පතිවරයා වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට

දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකාර පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.